## ගිළිහෙන ස්මෘතිය, එනම් රික්තයක මතකය

### මාලතී කල්පනා ඇම්බ්‍රෝස්

මතකයන් බිඳෙන් බිඳ
ගිලිහෙන විට
කාලයට නමක් දිය යුතු නම්
ශෝකය යයි කියනු මැන

දෙඇස්වල අවසාන එළි පොද
නිවී නො නිවී සිඳී යන විට
ප්‍රේමයට පර්යාය පද අවැසි නැත,
ඉඳහිට වැළඳ ගනු මැන

බෙදා ගත් දිවියක
සදාකාලික මතකය
කිසිවකින් මකනු බැරි බව
නිදාගත් මා හෘදයට
නිරතුරුව සිහිපත් කර දුන මැන

රික්තයක් තුළ නිහඬ ගොළු බව
දරා ගනු බැරි දිනයෙක,
සමු ගැනුම් අවැසි නැත
කිසිත් නොකියා ඉවත යනු මැන

කළු කුහරයක් මැද
අරුත් ගිලිහුණු ස්මෘතිය
ඝන ශුන්‍ය දෑසක
ඇස් පියන් යට තබා යනු මැන

හිස්කමක් මිස කිසිත් නො පෙනෙන
අන්ධකාර ම හදක පතුළත
මිදී ඝන වී කියනු බැරි වූ
ආදරය නම් දෙයක් තිබුණේය,
එයම පමණක් රැගෙන යනු මැන.

## 1971

### අනුරසිරි හෙට්ටිගේ

වීදියේ පහළ කෙළවර - තෙමංසල
ඉස්ටෝරු බිත්තියේ
මෑදු අතින් ඇඹදි - රතු අකුරු
සිනාසෙනවා තවමත් - සිත පතුල පිරිමැද -මැද
නම නොදන්නා සුමිතුරු
උස කෙට්ටු අය්යා - නුඹ
මතකද හිනාහුණා මා එක්ක
හොටු නාවර පෙරාගත් - ඒ පොඩි එකා මම

අවුරුදු පණිවිඩය ගෙන
කපුටු බෝගස ලැග
කොවුලාද විමසන්නෙ - නුඹ ගැන
ඉස්ටෝරු වහල උස
පරාලේ එල්ලිගෙන
උස ම උස බිත්තියේ
මරණය තනි අතින් ගෙන
මේ අකුරු-  රතු අකුරු
ලියූ බව නුඹ - දන්නෙ කවුරුද මම මිස

"දණින් වැටී ජීවත් වනවාට වඩා දෙපයින් නැගිට
මිය යාම සැපතක් ය"

බලා හිටියා මං
ජීවිතේ වැඩි කාලයක්
නුඹ යළි දකින්නට
දන්නවද නම නොදන්නා අය්යේ
මං තව ම එතන
ඒ අකුරු යට
දෙපයින් ම සිටගෙන
නුඹ එන්නෙ කවදා ද?

(සන්තබස්තියම් වීදිය කාව්‍ය සංග්‍රහයේ 26 පිටුව* තුන්වන කවිය)

## නිදහස යදිමි..

### ගයාන් ඉන්දුල කොඩිතුවක්කු

බලාපොරොත්තු සිනිඳු තිර
උනා දමා විසිකර
හිට ගනිමි නග්නව
ප්‍රාණ ඇපකරුවකු ලෙස
නුඹ තනා දුන් මහ පොළොව උඩ

දාර කළුවර කැබලි හංගා
හීන පිරුවට පාට තවරා
තනා දුන් ශ්‍රී හෘද පිළිරුව
නැවත දී හිස නවමි අඳුරට

පැමිණ සිප වැළඳ නික්මෙන
සඳුන් සුවඳයි කියූ සියොළඟ
ඉතින් දන් දී හිඳිමි නොසැලී
උරා බොනු වස් අධම නිරුවත

එනු ගනු නොපමාව
සියළු දෑ හිමිකාර නුඹ
ආත්මය ද හෙවනැලි ද එකවර
සුසුමකට හෝ පවරා නිදහස




## එක තාරුකාවක් නිමුනොත්

### රසිකා ගුණවර්ධන

කනින් ඇද විසිකර සඳකත
නිමන්නෙමි පහන් හනි හනිකට
තාරුකා කියවන අසුනක
වැතිර ඉමි සඳළුතලයෙහි මම.

ඈත තරුවක නිහඬ කුටියක
කවුළුවක් ඇරේ සුපුරුදු ලෙස
ඉඳී කිසිවෙකු සඳළුතලයක
මා මෙන්ම තාරුකා කියවන.

සිනිඳු කෙහෙ සෙලවෙයි සුළඟට
මධු විතක් හිස්වෙයි මඳ ලෙස
ශාප කරමින් රැයේ අඳුරට
හීන පොත දිග හැරේ හෙමිහිට.

නොදන්නා කෙනෙක් ඈත තරුවක
අත නොපොවනා ඉතා ඉහළක
නිවී යන්නට ප්‍රථම රාත්‍රිය
ඉතින් සැනසෙන් බලා දුර සිට.

එක තාරුකාවක් නිමුනොත්
දිදුළන තාරුකා ඇත තව
එහෙත් ඉන් ලද මිහිරි උණුසුම
ගින්දරක් සේ දවනු ඇත හද.

## දෛවෝපගතය

### ප්‍රේමවංශ දසනායක

වැහැරුන සිරුර හැකිලුන මුව ගිලුනු නෙත
ඔබ දිවි ගමන නිහඬව ලකුණු කර ඇත
නැති බැරි කම සමග පොර බදනා දෑත
කරගැට වරන දිනයක් හමුවෙද මෑත

එක පොළොවටයි ඔබ උන් මෙහි උපන්නේ
දෙවිදියකටයි උන් ඔබ හද ගැහෙන්නේ
දිවි රැකුමටයි උන් නැගි ගැල අදින්නේ
දෙවියන් බඹුන් නැතිවද එය දකින්නේ

ගහකොළ සතුන් සිවුපාවුන් මේ දෙරණේ
බිහිවෙති මියෙති සැම එක ලෙස වන අරණේ
බලගතු සමාජය බිහිකල රැකවරණේ
උනටම පමණි නැත ඔබ හට හවිහරණේ

හදවත පෙළන දුක් දොම්නස් දරා ගෙන
ඔබගෙන් පැහැරගත් අයිතිය පතාගෙන
එළඹෙන හෙට දිනය වෙත නෙත යොමාගෙන
කොපමණ දුරක් යන්නෙද ඔබ මේ ගමන

## සිතුවිලි

ටික කලකට නමුදු අතහැර උපන් රට
ආවෙමු අප දෙදෙන අප දෙපුතුන් ළඟ ට
සැමවිට සිහි උනත් ලස්සන මගේ ර ට
සැනසිය හැකිය දරුවන් ළඟ සිටින විට

ආදර පුතු දෙපල සහ දූවරු දෙදෙ න
මුනුබුරු සමඟ අප මිනිබිරියන් දෙදෙ න
සැමවිට ආදරය පා උවටැන් කර න
සිතමින් සිටිය හැක ඒ බව සැනසෙමි න

සැමතැන පෙනෙයි සැමගේ ඇති කලබල ය
සැමදෙන හොඳින් ගෙවමින් ඇත නිම දිවි ය
දරුවන් අපේ ලැබගෙන දියුණුවෙ සවි ය
සිටිනා විටදි සතුටක් හදතුල ඇති ය

හෙළ සිරිතට ද බොදු දහමට ගරු කර න
සිංහලකම රකින දරුවන් ඇත නිති න
බොදු දම දෙසන අපගේ හිමි වරු කර න
සේවය අමිල මෙමනිති සිහි කරනු මැ න

මෙහි සැම කෙනෙක් හට නිදහස විඳින්න ට
දරුවන් හට ඉහළ දැනුමක් ලබන්න ට
සලසා තිබෙන සැප සම්පත් දකින වි ට
ගරු කළ යුතුය අපි කැන්ගරු දේශය ට

සැමදෙන සමගියෙන් හොඳ දේ ලබාගෙ න
අපහට අහිත දේවල් දුරු කරමින් න
තම මව්බිමේ අභිමානය රකිමින් න
කවදා නමුත් අප සිරිලකටම එන් න

**මියුලින් කොස්සින්න,**
හයිෆීල්ඩ් ස්ට්‍රීට්, ඩියුරැක්, බ්‍රිස්බේන් (හොරණ, ශ්‍රී ලංකාව)